කො/දේවි බාලිකා විද්‍යාලය - කොළඹ
පළමු වාර පරීක්ෂණය - 2016 (මාර්තු)

කතෝලික ධර්මය - I

6 ශ්‍රේණිය                                                                 කාලය පැය 1 1/2 යි

## 1 - කොටස

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01) හිස්තැන් පුරවන්න.

1. කිතුණුවන්ගේ පූජනීය ග්‍රන්ථය ........................................ වේ.
2. ජේසුතුමාගේ මව .................................... තුමිය වේ.
3. ස්නාවක ජොහාන්තුමාගේ මව .................................... තුමිය වේ.
4. ශු. බයිබලයේ පුරාණ ගිවිසුමට අයත් පොතකි ....................................
5. ලූක් ශුභාරංචියේ සංකේතය .................................... වේ
6. සුවිශේෂක ජොහාන්තුමා .................................... තුමාගේ සොහොයුරෙකි
7. ජොහාන්තුමාගේ ශුභාරංචියේ සංකේතය .................................... වේ.
8. ශු.බයිබලයේ මැවීමේ කතාව අඩංගු වන්නේ .................................... පොතේය.
9. දෙවියන් වහන්සේගේ උතුම් ම මැවිල්ල .................................... වේ.
10. ආදි පිතෘවරයෙකි .................................... තුමා

(ජාකොබ්, එලිසබෙත්, ආබ්‍රහම්, ශු.බයිබලය, ගවයා, උත්පත්ති, මරියා, මිනිසා, ලෙවි ව්‍යවස්ථාව, රාජාලියා)

02) පහත ප්‍රකාශ හරිනම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.

1. ශුද්ධාත්ම දීමනා 12 කි. ( )
2. ශු.බයිබලයේ නව ගිවිසුම පොත් 27 කි. ( )
3. විශ්වාසයේ හා බලාපොරොත්තුවේ පදනම ශු.බයිබලය වේ. ( )
4. දෙමාපියන්ට සැලකීම හයවනු පණතට අයත්වේ. ( )
5. යාච්ඤා කිරීම කිතුණුවා දෙවියන් වහන්සේට ලංවන මාර්ගයකි ( )

03) යා කරන්න.

| | |
|---|---|
| 1. අපෝස්තුලුවරුන් දොළොස් දෙනාගෙන් කෙනෙකි. | ලූක් තුමා |
| 2. ශුභාරංචි ලියන ලද එකම අන්‍ය ජාතිකයා | ප්‍රසාද ස්නාපනය |
| 3. දෙවියන් වහන්සේ ලෝකයේ | ජන්ම පාපය |
| 4. පළමු පාපය | මතෙව් තුමා |
| 5. ආරම්භක ප්‍රසාද නිධානයකි | මැවුම්කරුවාණෝ |

- පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න. (මුළු ප්‍රශ්න 4 කි)

01) 6 ශ්‍රේණිය පළමු වාර ඇගයීම 'බයිබලයේ මුල් පොත්පහ' උපයෝගී කරගනිමින් ලියන ලද වාර්තාව ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ශු.බයිබලයේ පළමු පොත් පහ හඳුන්වන නම ලියන්න.
ii. ඒ සඳහා හදුන්වන වෙනත් නම් හතරක් ලියන්න.
iii. ශු.බයිබලයේ පළමු පොත් පහ නම් කරන්න.
iv. උත්පත්ති පොතේ සඳහන් දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තැබූ පුද්ගලයින් 3 නම් කරන්න.
v. උත්පත්ති පොතේ සඳහන් කරුණු 4 ක් ලියන්න.

02)

i. ශුභාරංචි හතර නම්කර එහි කතෘන්ගේ නම් ලියන්න.
ii. ශුභාරංචි සතර ලියූ කතෘවරු අතරින් ඔබකැමති කතාවරයෙකු පිළිබඳ වාක්‍ය 5 ක් ලියන්න.

03)

i. දෙවියන් වහන්සේ මැවූ ලෝකයේ අඩංගු දෑ 5 ක් ලියන්න.
ii. මැවිල්ල ආරක්‍ෂා කිරීමට 6 ශ්‍රේණිය තුළ ඉගෙනුම ලබන දියණියක ලෙස ඔබට පැවරී ඇති වගකීම් 5 ක් ලියන්න.

04)

i. දෙවියන් වහන්සේ මැවිල්ල සම්බන්ධයෙන් මිනිසාට පැවරූ වගකීම් මොනවාද ?
ii. දේව මැවිල්ල සම්බන්ධයෙන් කියැවෙන ගීතිකා 2 ක් ලියන්න.

05)

i. ශු.බයිබලයේ පළමු පොත්පහ හැඳින්වීමට යෙදෙන හෙබ්‍රෙව් පදය කුමක්ද ?
ii. ශු.බයිබලය අධ්‍යනයෙන් ලැබෙන ප්‍රයෝජන 5 ක් ලියන්න.

06)

i. දෙවියන් වහන්සේ ලබාදුන් දීමනා හා නව වසරේ බලාපොරොත්තු වෙනුවෙන් යැදුමක් ලියන්න.